| සසිරි | ජයෝදා | අද කෝටිපති | කප්රුක | සංවර්ධන වාසනාව | හඳහන | ශනිදා වාසනාව | ජාතික සම්පත | ධන නිධානය | මහජන සම්පත | ලග්න වාසනාව | සුපර් බෝල් | මෙගා පවර් | ගොවිසෙත |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 251 වැනි වාරය නොවැ: 20 වැනිදා | 1871 වැනි වාරය නො: 16 වැනිදා ඉංග්‍රීසි අකුර - Y | 1746 වැනි වාරය නොවැ: 20 වැනිදා ඉංග්‍රීසි අකුර - H | 1096 වැනි වාරය නොවැ: 20 වැනිදා ඉංග්‍රීසි අකුර - H සුපිරි අංකය - 09 | 546 වැනි වාරය නොවැ: 19 වැනිදා දෛව අංකය - 01 ඉංග්‍රීසි අකුර - B | 255 වැනි වාරය නොවැ: 21 වැනිදා ලග්නය: කුම්භ | 4081 වැනි වාරය නොවැ: 20 වැනිදා ඉංග්‍රීසි අකුර - V | 1401 වැනි වාරය නොවැ: 21 වැනිදා ජයග්‍රාහී ලග්නය - මීන | 976 වැනි වාරය නොවැ: 21 වැනිදා ජයග්‍රාහී අක්ෂරය - S | 4946 වැනි වාරය නොවැ: 21 වැනිදා ඉංග්‍රීසි අකුර - C | 3632 වැනි වාරය නොවැ:20 වැනිදා ලග්නය - වෘශ්චික | 1920 වැනි වාරය නොවැ:20 වැනිදා ඉංග්‍රීසි අකුර - D | 1294 වැනි වාරය නොවැ: 21 වැනිදා සුපිරි අංකය: 10 ඉංග්‍රීසි අකුර - Z | 3188 වැනි වාරය නොවැ: 21 වැනිදා ඉංග්‍රීසි අකුර - K |
| 01-06-48 | 08-13-17-70 | 26-54-55-66 | 06-31-46-66 | 05-08-21 | 05-36-57-62 | 09-26-37-65 | 3-2-6-2-9-1 | 07-13-56-68 | 4-8-6-4-8-8 | 09-25-49-62 | 15-28-73-76 | 62-65-68-76 | 11-45-50-72 |

# හදමින් සිටිද්දී බර අදින යන්ත්‍රය පණ ගැන්වී දෙදරු පියා මරුට

■ දඹුල්ල කාංචන කුමාර ආරියදාස

**බනිජ වැලි පිරිපහදු කොට විදේශ රටවලට අපනයනය කරන දඹුල්ල කණ්ඩලම හන්දිය ප්‍රදේශයේ කර්මාන්ත ශාලාවක යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කරමින් සිටි දෙදරු පියකු එහි 'පොක් ලිෆ්ට්' යන්ත්‍රය ක්‍රියාත්මකවී සිදු වූ අනතුරකින් පෙරේදා (20) රාත්‍රියේ මියගොස් ඇතැයි දඹුල්ල පොලිසිය කියයි.**

මියගොස් ඇත්තේ දඹුල්ල කජුවත්ත ප්‍රදේශයේ පදිංචි එච්.ජී. තිලකසිරි (47) දෙදරු පියෙකි.

බනිජ වැලි පිරිපහදු කරන කර්මාන්ත ශාලාවේ වැලි හලන යන්ත්‍රයක් අලුත්වැඩියා කිරීම සඳහා කාර්මික ශිල්පීන් කීපදෙනෙකු පෙරවරුවේ සිට සේවයකර ඇති අතර යන්ත්‍රය ක්‍රියාත්මක කරන අවස්ථාවේ දී එම යන්ත්‍රය ආපස්සට ක්‍රියාත්මකවී හිස කොටස යකඩ බාර් දෙකකට තද වීමෙන් තුවාල ලැබූ මෙම සේවකයා දඹුල්ල මූලික රෝහලට ඇතුළත් කරන විටත් මිය ගොස් සිටි බව පොලීසිය කියයි.


මියගිය කාර්මිකයා වසර 15 කට අධික කාලයක් මෙම පෞද්ගලික කම්හලේ සේවය කරන අයකු බව නිවැසියෝ පවසති.

දඹුල්ල මූලස්ථාන පොලිසිය සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ පවත්වනු ලබන අතර මෙහි වැඩ පාලකවරයාගෙන් සිද්ධිය සම්බන්ධයෙන් විමසීමේ දී කියා සිටියේ තමන් ඇතුළු කණ්ඩායම යන්ත්‍රසූත්‍ර අලුත්වැඩියා කරමින් සිටියදී මෙම අනතුර සිදුවූ බවයි.



අනතුරින් මියගිය එච්.ජී. තිලකසිරි

පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා සිරුර දඹුල්ල මූලික රෝහලේ තැන්පත් කර ඇති අතර සිද්ධිය සම්බන්ධයෙන් දඹුල්ල පොලිසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.



අනතුර සිදු වූ ස්ථානය


වසර හතරකට ආපු ගමනක් ශූ. දෙවැනි පෙළ පුටුව ලැබුණාලු. මුලට යන්න නොගත් වෙහෙසක් නැතිලු. කේලං කිව්වලු වැරදි හෙව්වලු ඒත් බැරි උනාලු. දැන් ඉන්නේ අන්තිම මොහොතේලු. අයවැය පරදන්න පොඩි ගේමක් ගහනවලු. වැඩේ හරි ගියත් මහ පුටුවට යන්න කල් නං නැහැලු. ගමන කොයි පිටත පෙරළෙයිද කියා අද හෙටම බලාගන්න පුළුවන්ලු. ගම් පහකට කෙළවර ගම් පියසකින් අසුනාලු.

පුෂ්පකුමාර මල්ලවආරච්චි




0112 600590 , 0112 600591 , 077 0129071
පිළියන්දල, කුරුණෑගල, නුවර, ගාල්ල, නුවරඑළිය


# සිසු පොළට ආ ප්‍රධාන ආරාධිතයා රුපියල් 10 කින් ඇඟ බේරාගෙන



■ පේරාදෙණිය - කුමාර රම්බොඩගෙදර

**පාසල් දරු දැරියන් විසින් සංවිධානය කරනු ලැබූ සිඟිති පොළ විවෘත කිරීම සඳහා පාසල් තුර්ය වාදක කණ්ඩායම පෙරටු කරගෙන ගරු ගාම්භීරව පොළ භූමියට කැඳවා ගෙන ගිය ප්‍රධාන ආරාධිතයා රුපියල් 10 ක් ලබා දී ගොටුකොළ මිටියක් පමණක් ලබාගත් පුවතක් මහනුවර ප්‍රදේශයෙන් වාර්තාවේ.**

මහනුවර ප්‍රදේශයේ විදුහලක දරු දැරියන් විසින් සංවිධානය කරන ලද සිඟිති පොළ විවෘත කිරීම සඳහා නගරයේ රාජ්‍ය ආයතනයක ප්‍රධානියෙකු සඳහා ආරාධනා කර තිබිණි. ප්‍රධාන ආරාධිතයා පාසල් තුර්ය වාදක කණ්ඩායම පෙරටු කර ගෙන ගරු ගාම්භීරව පොළ භූමියට කැඳවාගෙන ගියේ මඟ දෙපස රැඳී සිටි මවුපියන්ගේ අත්පොළසන් මධ්‍යයේය.

දවසේ සැක්කි

පොළ භූමියේ සැරිසැරූ ප්‍රධාන ආරාධිතයා එක් වෙළෙඳ කුටියකින් රුපියල් 10 ක් ලබා දී ගොටුකොළ මිටියක් ලබාගෙන ඉවත්ව යාමට සැරසුණු අවස්ථාවේ පුදුමයෙන් ඒ දෙස බලා සිටි සංවිධායක කමිටුව "තව මොනව හරි ගන්නවා ද සර්" කියා ඇසූ විට "නැහැ මේ ඇති" යැයි කියා ඇත.

පසුව ආරාධිත අමුත්තා සංවිධායක කමිටුව විසින් පිළියෙළ කරන ලද තේ පැන් සංග්‍රහයේ ද බුක්ති විඳ මිලදී ගත් ගොටුකොළ මිටිය ද රැගෙන පිටත්ව ගියේ සංවිධාන කමිටුවට ද ස්තුති කරමිනි.


## තිස්ස හේවාවිස්සගේ හිනා වැස්ස









01 වැනි පිටුවෙන්...

# මත්කරල් 1299 එක්ක ටියුෂන් ගුරු අත්අඩංගුවට

■ ශ්‍රීනාත් ප්‍රසන්න ජයසූරිය

**පාසල් සිසුන්ට මත් කරල් විකිණූ බව කියන උපකාරක පන්ති ගුරුවරයකු කළුතර ප්‍රදේශයේ දී සැකපිට අත්අඩංගුවට ගන්නා ලදැයි පොලිස් විශේෂ කාර්ය බළකාය පවසයි.**

සැකකාර ගුරුවරයා සන්තකයේ මත් කරල් 1299 ක පමණ තොගයක් ද තිබී විශේෂ කාර්ය බළකා නිලධාරීන්ගේ භාරයට ගෙන ඇත.

වෛද්‍යවරයකුගේ නිර්දේශයකින් තොරව ළඟ තබා ගැනීමට තහනම් කර ඇති මෙම උත්තේජක ඖෂධ වර්ගය මත්ලෝලීන් මත්ද්‍රව්‍යවලට ආදේශකයක් වශයෙන් පාවිච්චි කරන බව පොලිස් විශේෂ කාර්ය බළකායේ උසස් නිලධාරියෙක් ලංකාදීපයට පැවසීය.

සැකකරු මේවා පාසල් සිසුන් ඉලක්ක කර ගනිමින් අලෙවි කර ඇති බවට තොරතුරු ලැබී ඇතැයිද පොලිස් විශේෂ කාර්ය බළකාය සඳහන් කරයි.

සැකකරු 4, 5, 6, 7 යන ශ්‍රේණිවල සිසුන් සඳහා ගණිතය හා විද්‍යාව විෂයයන් උගන්වන උපකාරක පන්ති ගුරුවරයකු යැයිද විශේෂ කාර්ය බළකාය කියයි.

මාවනැල්ල ප්‍රදේශයේ පදිංචි මෙම සැකකරු බිරිඳ හා දරු දෙදෙනා ද සමග කළුතර ප්‍රදේශයේ විද්‍යාලයකට නුදුරින් කුලී නිවසක පදිංචිව සිටි අයකු යැයි ද පොලිස් විශේෂ කාර්ය බළකායේ එම නිලධාරියා සඳහන් කළේය.

පොලිස් විශේෂ කාර්ය බළකායේ අණදෙන නිලධාරි නියෝජ්‍ය පොලිස්පති නීතිඥ වරුණ ජයසුන්දර මහතාගේ උපදෙස් මත ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අතුල රත්නායක මහතාගේ මෙහෙයවීම යටතේ විශේෂ කාර්ය බළකායේ කටුකුරුන්ද පුහුණු පාසලේ ප්‍රධාන පොලිස් පරීක්ෂක චමිල මාරපන මහතා ප්‍රධාන පොලිස් කණ්ඩායමක් මෙම වැටලීම සිදුකර මත් කරල් සමග සැකකරු



අත්අඩංගුවට ගෙන ඇත.

වැඩිදුර පරීක්ෂණ සඳහා සැකකරු කළුතර දකුණ පොලිස් ස්ථානයට බාර දුන් බවද පොලිස් විශේෂ කාර්ය බළකාය පවසයි.

# රේගු බදු - රේගු නොවන බදු වසර 5ක් ඇතුළත ඉවතට

■ අංජුල මහික වීරරත්න

**කර්මාන්ත හා නිෂ්පාදන තරගකාරීත්වයට මුහුණදීම සඳහා වෙළෙඳ ගැළපුම් වැඩසටහනක් සමඟින් වසර පහක් ඇතුළත රේගු බදු සහ රේගු නොවන බදු ඉවත් කිරීමට රජය අපේක්ෂා කරන බව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා පැවසීය.**

රජය මෙම පියවර සම්බන්ධයෙන් ලෝක බැංකුව සහ ආසියා සංවර්ධන බැංකුව සමග සාකච්ඡා ආරම්භ කර ඇති බවද ජනාධිපතිවරයා කීය. ජනාධිපතිවරයා මේ බව සඳහන් කළේ කොළඹ විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථියින් පසුගිය 18 ද කොළඹ ෂැංග්‍රිලා හෝටලයේ දී සංවිධානය කර තිබූ 2023 අය වැය පසු විපරම් සමුළුව අමතමිනි. "බාධක අභිබවා ඉලක්ක වෙත ළඟා වීම" තේමාව යටතේ මෙය සංවිධානය කර තිබිණි. ආර්ථික අර්බුදයෙන් රට ගොඩගැනීමේ දී රජයට පමණක් නොව, පෞද්ගලික අංශයට ද විශාල කාර්යභාරයක් පැවරී ඇති බව පෙන්වා දුන් ජනාධිපතිවරයා රජයේ අරමුණ ව්‍යාපාර කිරීම නොව සෞඛ්‍ය, අධ්‍යාපන, සුබසාධන වැනි ජනතා අවශ්‍යතා සපුරාලීම බව ද අවධාරණය කළේය.

**මෙහිදී තවදුරටත් අදහස් දැක්වූ ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා:-**

මා හොඳින්ම දන්නා කරුණ නම් ආර්ථික වර්ධනය වන විට ඊට අනුරූපිව පෞද්ගලික අංශය වර්ධනය වීමයි. රජයකට ව්‍යාපාර පවත්වාගෙන යන්න බැහැ. රජය ව්‍යාපාර පවත්වාගෙන යාමෙන් අධ්‍යාපනය, සෞඛ්‍ය, නිවාස වැනි අංශ වෙත යෙදවිය හැකිව තිබූ මුදල් රුපියල් බිලියන, ට්‍රිලියන ගණන් විනාශ වී තිබෙනවා. එමෙන්ම අපට අතපසු වී ඇති සමාජ සුබසාධනයට අපි මුදල් වැය කළ යුතුයි. ව්‍යාපාර කරගෙන යාම දේශීය සහ විදේශීය පෞද්ගලික අංශ වෙත ලබාදිය යුතුයි.

ශ්‍රී ලංකා ටෙලිකොම් වැනි ලාභ ලබන ආයතන විකුණා දමන්නේ ඇයි කියල තවමත් සමහරු අපෙන් අහනවා. අපි ඒවායින් ලබා ඇති ලාභය කොපමණද?, අනාගතයේ දී අපි ඒවාට මොනතරම් මුදලක් යෙදවිය යුතුද? කියලා මහා භාණ්ඩාගාර ලේකම්වරයාගෙන් ඇහුවොත් ඔහු ඒ පිළිබඳ පැහැදිලි කරාවි. එම ආයතන පවත්වාගෙන යාමට අපට මුදල් නැහැ. මේ රටේ ජනතාව ශක්තිමත් කරනවාද,? නැත්නම් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ශ්‍රී ලංකා ගුවන් සේවය, ටෙලිකොම් වැනි ආයතනවලට මුදල් යොදවලා ඒවා නඩත්තු කරනවාද? කියලා අපි දැන් තීරණය කළ යුතුව තිබෙනවා.

මගේ අදහස නම් අපි ශක්තිමත් කළ යුත්තේ සමාගම් සහ ගොඩනැඟිලි නොවෙයි, රටේ ජනතාවයි. මම ඒ පිළිබඳ පැකිළෙන්නේ නැහැ. මොකද මට මේ රටේ ජනතාවට වඩා යහපත් ජීවන තත්ත්වයක් ලබාදීමයි අවශ්‍යව තිබෙන්නේ. එවන් අවස්ථාවක වැඩි වගකීමක් පැවරෙන්නේ පෞද්ගලික අංශයටයි.

මෙම අවස්ථාවට මුදල් අමාත්‍යාංශයේ ලේකම් මහින්ද සිරිවර්ධන, මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ, ශ්‍රී ලංකාව සඳහා වන ලෝක බැංකු අධ්‍යක්ෂ ෆාරිස් හඩඩ් ස්වෝස්, ආසියා සංවර්ධන බැංකුවේ මෙරට නියෝජිත ආචාර්ය චෙන් චෙන්, කොළඹ විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථයින්ගේ සංගමයේ සභාපති චන්දිම සමරසිංහ මහත්වරු ද එක්ව සිටියහ.

# ප්ලාස්ටික් බෝතල්වල දමා දියර කාබනික පෝර විකුණූ සමාගමක් 'බ්ලැක් ලිස්ට්'

■ අංජුල මහික වීරරත්න

**ප්ලාස්ටික් බෝතල්වල ඇසුරුම් කර දියර කාබනික පොහොර සපයන ලද කාබනික පොහොර නිෂ්පාදන සමාගමක් වහාම අසාදු ලේඛනගත කරන ලෙස කෘෂිකර්ම, වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍ය මහින්ද අමරවීර මහතා ජාතික පොහොර ලේකම් කාර්යාලයට උපදෙස් දී ඇත.**

ජාතික පොහොර ලේකම් කාර්යාලයේ නිර්දේශ අනුව දියර කාබනික පොහොර ප්ලාස්ටික් බෝතල්වල (ජල බෝතල් වැනි) ඇසුරුම් කිරීම සපුරා තහනම් කර ඇතැයි කෘෂිකර්ම අමාත්‍යාංශය කියයි.

එයට හේතුව එවැනි අසුරුම් තුළ දියර කාබනික පොහොර ඇසුරුම් කිරීම මගින් විවිධ ව්‍යාධිජනක (pathogens) හටගැනීම බවද කෘෂිකර්ම අමාත්‍යාංශය පවසයි.

මේ නිසා එම සමාගම වහාම අසාදු ලේඛනගත කරන ලෙසත්, එම සමාගම කාබනික පොහොර අලෙවි කර ඇත්නම් ඒ සඳහා කිසිදු මුදලක් නොගෙවන ලෙසත් අමාත්‍යවරයා උපදෙස් දී ඇත.

වලව කලාපයේ ගොවීන්ට කාබනික පොහොර සමාගමක් විසින් සපයන ලද පොහොරවල වැලි සාන්ද්‍රණය වැඩි බවට ගොවීන් චෝදනා කර ඇති බැවින් ඒ සම්බන්ධව ද වහාම විමර්ශනයක් කර වාර්තාවක් සපයන ලෙස කෘෂිකර්ම අමාත්‍යවරයා ජාතික පොහොර ලේකම් කාර්යාලයට උපදෙස් දී ඇත.

# රූපවාහිනී ගිය වසරේ කෝටි 22ක් පාඩුයි

■ මුදිතා දයානන්ද

**විගණන වාර්තාවක් කියයි**

**රූපවාහිනී සංස්ථාව 2021 වසරේදී රුපියල් දෙකෝටි හැත්තෑ තුන් ලක්ෂයක් පාඩු ලබා ඇතැයි වාර්තාවකින් අනාවරණය වේ.**

සංස්ථාව පසුගිය වසර පහක් තිස්සේ පාඩු ලබමින් පවත්වාගෙන ගොස් ඇති බවද 2018 වසරේදී පමණක් රාජ්‍ය ප්‍රදාන හේතුවෙන් ලාභ ලබා ඇති බවද එම වාර්තාවේ සඳහන් වේ.

එම වාර්තාව අනුව වසර අවසානයේ ණය ගැතියන්ගෙන් අය විය යුතු මුදල රුපියල් කෝටි 38කට ආසන්න වන අතර එයින් දහත් කෝටි පනස් ලක්ෂයක්ම රාජ්‍ය ආයතනවලින් අය විය යුතු ණය වේ. රාජ්‍ය ආයතනවලින් අය විය යුතු බව කියන ණය මුදලින් රුපියල් කෝටි නවයක හා පෞද්ගලික ආයතනවලින් ලැබිය යුතු බව කියන එක් කෝටි දස ලක්ෂයක ණය ශේෂ සනාථ කිරීමට සාක්ෂි නැතැයි ද එම වාර්තාවේ සඳහන් වේ.

මෙම සමස්ත ණය මුදලින් වසර හතර ඉක්මවූ ණය ප්‍රමාණය කෝටි දෙළහකට ආසන්න බවද එයින් නැවත අය කර ගැනීම සඳහා නීතිමය පියවර ගෙන තිබෙන්නේ කෝටි හතරකට ආසන්න මුදලක් සඳහා පමණක් බවද එහි දැක්වේ.

එම ණය මුදල් අතර පවතින රාජ්‍ය බැංකුවකින් ගෙවිය යුතු රුපියල් කෝටියක මුදල ගෙවීමට නොහැකි බවද එය විධිමත් ගිවිසුමකට එළැඹීමකින් තොරව සිදුකළ කාර්යයක් බවද එම බැංකුවෙන් දැනුම් දී ඇතැයි විගණන වාර්තාවේ සඳහන් වේ.

## බේරේ වැවේ රොන් මඩෙන්

# ඉඩම් සංවර්ධන සංස්ථාව 2019දී කෝටි 12ක් කාලා

■ සුජිත් හේවාජුලිගේ

**විගණන වාර්තාවක් කියයි**

**කොළඹ බේරේ වැවේ රොන්මඩ ඉවත් කිරීම සඳහා යන්ත්‍ර තුනක් මිලදී ගැනීමට ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව රුපියල් කෝටි විසිඅටක් ඇස්තමේන්තු කර තිබුණ ද එම ඇස්තමේන්තු ගත පිරිවැයට වඩා රුපියල් කෝටි 12 ක් 2019 වර්ෂයේදී වැඩපුර වැයකර ඇතැයි ජාතික විගණන කාර්යාලය නිකුත් කළ වාර්තාවක සඳහන් වේ.**

මෙම යන්ත්‍ර තුන මිලදී ගෙන ඇතැයි පැවසෙන්නේ අමාත්‍ය මණ්ඩලය 2019 වර්ෂයේ ජූලි මස 3 වැනිද ගත් තීරණයක් අනුවය.

මේ අතර ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව මුතුරාජවෙල අක්කර හතරක පමණ ඉඩමක් 2019 වර්ෂයේදී උපකල්බදු (Sublease) දීමේදී අය කළ යුතු ගාස්තු අඩුවෙන් ගණනය කිරීම හේතුවෙන් එම සංස්ථාවට රුපියල් කෝටි 5කට වැඩි පාඩුවක් සිදුවී ඇතැයිද එම වාර්තාවේ දැක්වෙයි.

මෙම ඉඩම උපකල්බදු දීමේ ගාස්තුව වූයේ රුපියල් පන්කෝටි හැට ලක්ෂයකි. එම ගාස්තුව රුපියල් ලක්ෂ විස්සක් ලෙස ගණනය කර අය කිරීම හේතුවෙන් මේ පාඩුව සිදුව ඇති බව විගණන අංශ පවසයි.

මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය පවා ලබාගෙන නැති බවද වාර්තාවේ දැක්වේ.

මේ තොරතුරු සඳහන් වන්නේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ 2019 වාර්ෂික වාර්තාවට ඇතුළත් කරනු ලැබ ඇති විගණන වාර්තාවේය.

# පාසල් ගණනාවක ගුරුවරියෝ සාරිය ඉවතලා ගවුම්-සාය හැට්ට-කලිසමට බසිති

## අලුත් ඇඳුම් පිටින් ගත් ඡායාරූප සමාජ මාධ්‍යයේ

■ ඩයනා උදයංගනී

**දිවයිනේ පාසල් ගණනාවක ගුරුවරියන් සාරිය වෙනුවට ගවුම්, සාය හැට්ට, කලිසම්, කුර්තා ආදී සැහැල්ලු ඇඳුම්වලින් සැරසී පාසල්වලට පැමිණ ඇතැයි වාර්තා වේ.**

එම ගුරුවරියන් වෙනත් ඇඳුම් ඇඳ පාසලට ගොස් ලබාගත් ඡායාරූප සමාජ මාධ්‍ය ඔස්සේ ද පළ කර තිබිණි.

වර්තමානයේ පවතින ආර්ථික උද්ධමනයත් සමඟ සාරිවල මිල ඉහළයාම හේතුවෙන්, මෙම පියවර ගත් බවත්, රාජ්‍ය සේවකයන්ට සුදුසු ඇඳුමකින් සැරසී සේවයට වාර්තා කළ හැකි බවට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් චක්‍රලේඛයක් ද නිකුත් කර ඇති නිසා තමන්ට ද එම අවසරය හිමි බවත් ඔවුන් සඳහන් කර ඇත.

එසේ පැමිණි තමන් සිසු දරුවන් ආදරයෙන් වැළඳගත් බව ද එම ගුරුවරියන් සමාජ මාධ්‍යවල සඳහන් කර ඇත.

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා නිකුත් කර ඇති චක්‍රලේඛය අනුව ගුරුවරියන්ට ද සාරිය වෙනුවට වෙනත් වෙනත් ඇඳුමකින් පාසල්වලට පැමිණීමට ඉඩදෙන ලෙස ලංකා ගුරු සංගමය ඇතුළු ගුරු සංගම් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මීට පෙර ඉල්ලීමක් ද කර තිබූ අතර එයට මහා සංඝරත්නය ඇතුළු පිරිස්වල විරෝධය එල්ල විය.

අධ්‍යාපන අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතා ද ප්‍රකාශ කර තිබුණේ ගුරුවරියන්ගේ ඇඳුම වන සාරිය හා ඔසරිය වෙනස් කිරීමට කිසිසේත්ම ඉඩ නොදෙන බවයි.

ඉන්පසු සමාජ මාධ්‍ය ඔස්සේ ඒකරාශී වූ ගුරුවරියන් කණ්ඩායමක් වෘත්තීය ගරුත්වය රැකෙන ආකාරයේ වෙනත් ඇඳුමකින් සැරසී පාසල් වෙත පැමිණීමට තීරණයක් ගෙන තිබූ අතර, ඔවුන් එලෙස භාවිත කළ හැකි ඇඳුම් සම්බන්ධයෙන් ද සමාජ මාධ්‍ය ඔස්සේ ගුරුවරියන් දැනුවත් කර තිබිණි.

ඒ අනුව, අඳින්නේ ගවුමක් හෝ සායක් නම්, එය දණහිසේ සිට පහළට අවම වශයෙන් අඟල් 4ක්වත් දිගු විය යුතු බවත්, කලිසමක් අඳින්නේ නම් ඒ සමඟ උකුල වැසෙන සේ කුර්තා ඇඳුමකින් සැරසිය යුතු බවත්, සියලු ඇඳුම් අත් සහිත ඒවා විය යුතු බවත් සඳහන් කර තිබිණි.

මේ සම්බන්ධයෙන් කළ විමසීමක දී ලංකා ගුරු සංගමයේ ප්‍රධාන ලේකම් ජෝශප් ස්ටාලින් මහතා පැවසුවේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්වරයා නිකුත් කර ඇති 5/2022 චක්‍රලේඛය අනුව සාරිය වෙනුවට වෙනත් ඇඳුමකින් පැමිණීමේ අයිතිය ගුරුවරියන්ට ද හිමි බවයි.

මෙය ගුරු සංගමයක බලපෑමෙන් සිදුවූවක් නොවන බවත්, ගුරුවරියන් ඔවුන් කැමැති, සංවරශීලී ඇඳුමකින් සැරසී පාසල්වලට පැමිණීමේ වරදක් නැති බවත් ඔහු සඳහන් කළේය.

# ගෘහසේවයට-සුද්ධ පවිත්‍ර වැඩට කතුන් අරාබි යැවීම තාවකාලිකව අත්හිටුවයි

■ නිමල කොඩිතුවක්කු

**කාර්යාංශය කියයි**

**එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ශ්‍රමිකයන් ලෙස රැකියා කාණ්ඩ දෙකකට යවන ශ්‍රී ලාංකික කාන්තාවන් ලියාපදිංචි කිරීම තාවකාලිකව අත්හිටුවා ඇත.**

ඒ අනුව මෙසේ අත්හිටුවා ඇත්තේ ගෘහ සේවය සහ පිරිසුදු කිරීමේ සේවාවන්වලට අදාළ ලියාපදිංචි කටයුතු බව විදේශ රැකියා නියුක්ති කාර්යාංශය පවසයි.

ලැබී ඇති පැමිණිලි සහ අක්‍රමිකතා පදනම් කරගනිමින් මෙම පියවර ගත් බවද එම කාර්යාංශය සඳහන් කරයි.

# සැප්තැම්බරයට වඩා ඔක්තෝබරයේ උද්ධමනය බහී

■ ඩයනා උදයංගනී

**ඉකුත් සැප්තැම්බර් මාසයේ දී සියයට 73.7ක් වූ උද්ධමනය මෙම මාසයේදී සියයට 70.6ක් දක්වා පහත වැටී ඇතැයි ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පවසයි.**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2022 ඔක්තෝබර් මාසය සඳහා නිකුත් කළ නිවේදනය අනුව සැප්තැම්බර් මාසයේ දී සියයට 85.8ක් වූ ආහාර උද්ධමනය මෙම මාසයේදී සියයට 80.9ක් දක්වා පහත වැටී ඇති අතර, ආහාර නොවන උද්ධමනය සියයට 62.8 සිට 61.3ක් දක්වා පහත වැටී ඇත.

එමෙන්ම සැප්තැම්බරයේ සිට ඔක්තෝබර් වන විට මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය සඳහා වන උද්ධමනය සියයට 55 සිට 50.2 ක් දක්වාත්, නිවාස, ජලය, විදුලිය, ගෑස් ආදිය සම්බන්ධ උද්ධමනය සියයට 39 සිට 34.7ක් දක්වාත්, ප්‍රවාහන උද්ධමනය සියයට 115 සිට 108.8ක් දක්වාත් වශයෙන් පහත වැටී ඇති බව එම නිවේදනයේ දැක්වේ.

මීට අමතරව සන්නිවේදන, අධ්‍යාපන ආදී අංශවලින් උද්ධමනයේ ඉහළයාමක් සිදුව ඇතැයි ද එම නිවේදනයෙහි සඳහන් වේ.

ඒ අනුව සැප්තැම්බරයේදී 25.8ක් වූ සන්නිවේදන සඳහා වන උද්ධමනය සියයට 34.8ක් දක්වාත්, සියයට 46.2ක් වූ විනෝදාත්මක හා සංස්කෘතික කටයුතු සම්බන්ධ උද්ධමනය සියයට 42.6 සිට සියයට 61.8 දක්වා සහ අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ උද්ධමනය සියයට 31.7 සිට 35.1 දක්වාත් මෙම මාසයේ දී ඉහළ ගොස් ඇත.

ගතවූ මාසයක කාලයේ දී ජාතික පාරිභෝගික මිල දර්ශකය 256.2 සිට 256.9 දක්වා ඉහළ ගොස් ඇති බව ද එම නිවේදනයෙහි දැක්වේ.

# ජනතාව අමාරුවෙන් සිටියදී රෙදි තොගයක් හාල්-සැමන් රේගුවේ දිරන්න ඇරලා

## මේවා සතුන්ට හරි කන්න දෙන්න

■ අංජුල මහික වීරරත්න සහ සුජිත් හේවාජුලිගේ

**නිමල් සිරිපාල**

**රෙදි තොගයක් ද හාල්, සැමන් ටින් ආදිය ද රේගුවේ අවුරුදු 20ක් තිස්සේ දිරාපත් වෙමින් තිබෙන බව වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ පැවසීය.**

රේගුවේ ගුදම් පරීක්ෂාවකට ගිය අවස්ථාවේ මේ කාරණය තමා දුටු බවද අමාත්‍යවරයා කීවේය.

අවුරුදු විස්සක් තිස්සේ තිබෙන නඩුවක් නිසා රෙදි තොගය දිරාපත් වෙමින් තිබෙන බව දැනගත් බව කී අමාත්‍යවරයා හාල්, සැමන් ටින් විශාල සංඛ්‍යාවක් ද දිරාපත් වෙමින් තිබෙන බව එහිදී දුටු බව කීය.

ජනතාව අමාරුවෙන් ඉඳිද්දී මේවා දිරාපත් වෙන බව කී අමාත්‍යවරයා මේවා සත්ව ආහාර සඳහා හෝ යොදා ගත නොහැකි දැයි ප්‍රශ්න කළේය.

එම ගැටලු පැනනැගීම වැළැක්වීම සඳහා රේගු ආඥා පනත කාලීන අවශ්‍යතා අනුව වෙනස් කළ යුතුව තිබෙන බවද අමාත්‍යවරයා පැවැසීය.

# හොර පාස්පෝට් එකකින් ඉතාලි යන්න හැදූ රාලහාමි කටාරයෙන් මෙරටට පිටුවහල්

■ ශ්‍රීනාත් ප්‍රසන්න ජයසූරිය

**ව්‍යාජ විදෙස් ගමන් බලපත්‍රයකින් කටාර් රාජ්‍ය හරහා ඉතාලියට යෑමට උත්සාහ කළ බව කියන පොලිස් කොස්තාපල්වරයකු කටාර් ගුවන් තොටුපොළේ බලධාරීන් විසින් අල්ලාගෙන මෙරටට පිටුවහල් කරනු ලැබීමෙන් සැකපිට අත්අඩංගුවට ගෙන ඇත්තේ කෙසෙල්වත්ත පොලිසියේ රාජකාරි කළ පොලිස් කොස්තාපල්වරයෙකු යැයි රහස් පොලිසියේ උසස් නිලධාරියෙක් කීය.**

ඔහු දින තුනක කාලයකට නිවාඩු ලබාගෙන පොලිස් ස්ථානයෙන් පිටව ගොස් සිටි අයකු යැයි ද රහස් පොලිසිය සඳහන් කරයි.

කොස්තාපල්වරයා අත්අඩංගුවට ගනු ලැබූ රහස් පොලිසිය සැකකරු සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වයි.

# පිල්ලෙයාන් මඩකලපුවේ අක්කර 44ක් අල්ලගෙන

**මන්ත්‍රී රාසමාණික්කම් කියයි**

■ සුජිත් හේවාජුලිගේ සහ අංජුල මහික වීරරත්න

**රටේ ජනතාවට ඉඩම් ලක්ෂයක් බෙදද්දී රාජ්‍ය අමාත්‍ය සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් (පිල්ලෙයාන්) දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ සභාපතිවරයා ලෙස මඩකළපුවේ ඉඩම් අක්කර 44 ක් නීති විරෝධීව අත්පත් කරගෙන ඇතැයි මඩකලපු දිස්ත්‍රික් මන්ත්‍රී චාණක්‍ය රාසමානික්කම් මහතා පාර්ලිමේන්තුවේදී ඊයේ (21) චෝදනා කළේය.**

බොරු නම් එය ඔප්පු කර පෙන්වන්නැයි තමා ඔහුට අභියෝග කරන බවද මන්ත්‍රීවරයා සඳහන් කළේය.

හිටපු මන්ත්‍රීවරයකුගේ අක්කර 8 ක ඉඩමක් ශිවනේෂතුරෙයි චන්ද්‍රකාන්තන්ගේ මස්සිනා හොර ඔප්පුවක් ලියා අල්ලාගෙන ඇති බවත්, ඒ ඔප්පුව ලියා ඇත්තේ පස්වැනි එළිසබෙත් රැජින දුන් තෑග්ගක් විදියට බවත් ඔහු කීවේය.

ළඟදී නැතිවුණේ දෙවැනි එළිසබෙත් රැජින බව කී රාසමානක්කම් මහතා මෙතුමා හොර ඔප්පුවක්වත් හදන්න දන්නේ නැති මනුස්සයකු බවද ප්‍රකාශ කළේය.

එසේම ඔහු මඩකලපුවේ කැලෑ එළිකර වැලි පටවන බවටද හෙතෙම චෝදනා කළේය.


මන්ත්‍රීවරයා මෙසේ චෝදනා කළේ අයවැය විසර්ජන පනත් කෙටුම්පත පිළිබඳ දෙවැනි වර කියවීමේ විවාදයේදීය.

කටුනායක ගුවන් තොටුපොළට පැමිණි ආර්ථික ඝාතකයා පිළිගැනීමට ඇමැතිවරුන් රාජ්‍ය ඇමැතිවරුන් ලජ්ජා නැතිව එහි ගොස් සිටි බවද චාණක්‍ය රාසමානික්කම් මහතා පැවසීය.

ආර්ථික ඝාතකයාට පොලිස් ආරක්ෂාව ලබාදී තිබූ බවද ඔහු සඳහන් කළේය.

එද රට යද්දී ආගමන විගමන නිලධාරීන් එසේ යෑමට ඉඩ නොදීම හේතුවෙන් ආපසු පැමිණි ආර්ථික ඝාතකයාට අද කටුනායක ගුවන් තොටුපොළේ සිට එක්කගෙන එන්නේ පාවාඩ දමා යැයි පැවසූ මන්ත්‍රීවරයා අනෙක් ආර්ථික ඝාතකයා කබ්රාල් පොතක් ලියා ඇතැයි ප්‍රකාශ කළේය.

ආර්ථික ඝාතනයා ආර්ථිකය ගැන පොතක් ලිවීම විහිළුවක් බව ඔහු පැවසීය.



# ඉන්දියාවේ වාහන 48 ක් එක පොදියට හැපිලා

■ නවදිල්ලියේදිය (එන්.ඩී.ටීවී.)



**ඉන්දියාවේ පූනේ නගරයේ, නවේල් පාලමට ඉහළින් දිවෙන පූනේ - බැංගලෝර් අධිවේගී මාර්ගයේ වාහන 48 ක් එකිනෙක ගැටීමෙන් 30 දෙනකු තුවාල ලබා රෝහල්ගත කෙරුණි. තුවාල ලැබූ කීප දෙනකුගේ තත්ත්වය බරපතල බව රෝහල් ආරංචි මාර්ග පවසයි.**

වේගය පාලනය කර ගැනීමට නොහැකි වූ තිරිංග අක්‍රිය වුණු ඉන්ධන බවුසරයක් මෝටර් රථ කීපයක හැපීමෙන් අනතුර සිදුවුණු බව පොලිසිය පවසයි.

අනතුරින් කුඩා මෝටර් රථ කීපයක් පොඩි පට්ටම් වී ගිය අතර, ඒවා තුළ සිරවුණු පිරිස් මුදා ගැනීමට පූනේ ගිනි නිවන හටයෝ යුහුසුළු වූහ. ගිනි නිවන හටයන්ට පූනේ නගර සංවර්ධණ අධිකාරියේ නිලධාරීන්ගේත් පොලිසියේත් සහාය හිමිවිය.

අනතුරත් සමඟ මුම්බායි නුවර බලා යන ප්‍රධාන මාර්ග රැසක් මුළුමනින්ම අවහිර වූ බව ද මාධ්‍ය වාර්තා කළේය. කිලෝ මීටර් දෙකක් හෝ තුනක් දිගට වාහන තදබද දකින්න ලැබුණු බව ද පැවැසිණි.

පසුගිය කාලය පුරාවට පූනේ නගරයේ, නවේල් පාලමට ඉහළින් දිවෙන මාර්ගයේ රිය අනතුරු බහුලව සිදුවුණු බව පොලිසිය පවසා ඇත.

# ඇමෙරිකා ජනාධිපති ජෝ බයිඩන්ට 80 යි

■ වොෂින්ටනයේදිය (එන්.ඩී.ටීවී.)

**ඇමෙරිකා ජනාධිපති ජෝ බයිඩන්ගේ 80 වැනි ජන්ම දිනය පෙරේදා (20) ට යෙදී තිබුණි. ඇමෙරිකාවේ වසස්ගතම ජනාධිපති ලෙස සැලකෙන්නේ ජෝ බයිඩන්ය.**

බයිඩන් ජනාධිපති ධුරයට පත් වෙද්දී ඔහුගේ වයස අවුරුදු 78 ක් විය. ජනපති ධුරය හොබවන ජනාධිපතිවරයකු 80 වැනි ජන්ම දිනය සැමරූ පළමු අවස්ථාව මෙය යැයි ඇමෙරිකන් මාධ්‍ය වාර්තා කර තිබේ.

# මාස 6 කට පසු චීනයෙන් 'කොරෝනා' මරණයක්

■ බෙයිජිංහිදීය (ඒ.එෆ්.පී.)

**මාස 6 කට පසු චීනයෙන් 'කොවිඩ් 19' මරණයක් වාර්තා විය. මියගොස් ඇත්තේ 87 හැවිරිදි පුද්ගලයකු බවත්, ඔහු බෙයිජිං අගනුවර වැසියකු බවත් චීන සෞඛ්‍ය අමාත්‍යාංශය නිකුත් කළ නිවේදනයක සඳහන් වෙයි.**

චීනය 'කොවිඩ් 19' වයිරසය පාලනය කරන්නේ දලදඬු සෞඛ්‍ය නීතිරීති ක්‍රියාත්මක කරමිණි. ආසාදිතයකු වාර්තා වුවහොත්, පළාත් සහ නගර මුළුමනින්ම ලොක්ඩවුන් කර, සියලු දෙනා 'කොවිඩ් 19' පරීක්ෂණවලට යොමු කර ආසාදිතයන් හඳුනා ගැනීම චීනයේ 'කොවිඩ් 19' ප්‍රතිපත්තියයි. චීන රජයේ මෙම දලදඬු සෞඛ්‍ය නීති එරට වැසියන්ගේ දැඩි අප්‍රසාදයට පවා හේතුවක් වී තිබේ. ගතවුණු පැය 24 ඇතුළත චීනයෙන් වාර්තා වුණු නව ආසාදිතයන් ගණන 24,000 කි.

# හොංකොං නායකයාට 'කොරෝනා' ආසාදනය වෙයි

■ හොංකොංහිදීය (රොයිටර්)

**හොංකොං නායක ජෝන් ලී 'කොවිඩ් 19' ආසාදිතයකු බව තහවුරු විය. ජෝන් ලී ආසාදිතයකු බව තහවුරු වූයේ 'ආසියා පැසිෆික් සහයෝගීතා සමුළුව හෙවත් 'ඇපෙක්' සමුළුවට සහභාගී වී ආපසු හොංකොං පැමිණීමෙන් පසුවය.**

'ඇපෙක්' සමුළුව පැවැත්වූයේ තායිලන්තයේ බැංකොක් නුවරය. සමුළුවේදී නායක ජෝන් ලී සහ චීන ජනාධිපති ෂී ජින්පින් අතර මුහුණට මුහුණ හමුවක් ද පැවැත්විණි.

ආපසු හොංකොං බලා පැමිණීමෙන් පසු නායක ජෝන් ලී 'කොවිඩ් 19' ආසාදිතයකු බව තහවුරු වුණු බැවින්, වෛද්‍ය උපදෙස් අනුව ඔහු නිවසට වී නිරෝධානයේ පසුවන බව හොංකොං රජය නිකුත් කළ නිවේදනයක දැක්වෙයි. නායක ජෝන් ලී නිවසේ සිට රාජකාරි සිදු කරනු ඇති බව ද එම නිවේදනයේ වැඩිදුරටත් සඳහන් වී ඇත.

## තුන්මංසල

බදු වැඩිවූ නිසා බඩු මිල ඉහළ ඇදී
අසරණ අහිංසකයන්ගේ බඩට වදී
අය වැයෙනුත් යන්තම් වත් සහන නොදී
පෙන්නුයේ අනාගතයට සිහින පොදී

තිලක




කොහොමද යන්නෙ පාසල් දෙයියං පල්ල
පොත් පත් උපකරණ මිල නැත වී මෙල්ල
එය දැක සොම්නසින් ගන්නම සැනසිල්ල
අත්පොඩි ගහන්නලු සීයා කිරිඇල්ල







කෝටි 28+ Mega POWER මෙගා පවර්

දිනුම් වාරය : 1292

දිනා ඇති මුළු මුදල රු.4,443,880.00

මීළඟ මෙගා සුපිරි ත්‍යාගය රු.280,948,750.00

මීළඟ පවර් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00

මීළඟ ගුණ්ඩි සුපිරි ත්‍යාගය රු.10,000,000.00

ඉංග්‍රීසි අකුර: C | සුපිරි අංකය: 17 | ජයග්‍රාහී අංක: 19 60 62 77

2022-11-21 දින මෙගා පවර් 1292 වාරයේ ප්‍රතිඵලය පුවත්පතේ පළවීමේදී සිදුවූ ඉංග්‍රීසි අක්ෂරයේ වරද, නිවැරදි කිරීම.



# සේල්

## කාර්මික / විදුලි උපකරණ සහ විවිධ ආලෝක සැපයුම් උපකරණ

පහත සඳහන් ඉවතලන සහ යල්පැන ගිය අයිතම තොග ඉහළම මිලට විකිණීමට ඇත. පරික්ෂා කිරීමට පෙර දැනුම් දීමකින් කාලය වෙන් කරවාගන්න.

| Category Name | Item Group |
|---|---|
| Lot 1 | Plug & Sockets, European tension Connectors for overhead lines, assorted Fuses/bases, Oil circuit Breakers, lugs, Leftover metal components + miscellaneous industrial electrical items |
| Lot 2 | PVC Tapes old stock-7 colours mixed lot and high quality PVC Bends-Colour Black. |
| Lot 3 | Industrial, Commercial & Outdoor fittings (left over from shipments) - new, used Mirror louver fittings, downlights, batten fixtures, Metal halide/CFL lamps etc |

ස්ථානය : වත්තල

අමතන්න : ප්‍රදීප් 0777 782 772


# දහයයි-10 තරගාවලිය ජූලි මාසයේදී

**ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පළමු වරට සංවිධානය කරන ලංකා දහයයි-10 ලීග් ක්‍රිකට් තරගාවලිය ලබන වසරේ (2023) ජූලි මාසයේදී පැවැත්වීමට සැලසුම්කර තිබේ. පිරිමි සහ කාන්තා යන අංශ දෙකෙන්ම මෙම තරගාවලිය පැවැත්වීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය බලාපොරොත්තු වන අතර ලොව එවන් තරගාවලියක් පැවැත්වෙන පළමු අවස්ථාවද මෙය වනු ඇත.**

එහිදී පිරිමි තරගාවලිය සඳහා කණ්ඩායම් 6 ක්ද, කාන්තා තරගාවලිය සඳහා කණ්ඩායම් 4 ක්ද ඇතුළත් කරගැනීමට නියමිත අතර සෑම කණ්ඩායමකටම දේශීය ක්‍රීඩකයන් 10 දෙනකු සහ විදෙස් ක්‍රීඩකයන් 6 දෙනකු බැගින් ඇතුළත් කර ගැනීමටද නියමිතය.

ලබන වසරෙන් පසුව එළඹෙන සෑම වසරකදීම අගෝස්තු මාසයේදී ලංකා ප්‍රිමියර් ලීග් විස්සයි-20 තරගාවලිය පැවැත්වීමටත්, ඉන් අනතුරුව දෙසැම්බර් මාසයේදී ලංකා දහයයි-10 තරගාවලිය පැවැත්වීමටත් අපේක්ෂා කරන බව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ බලධාරීහු කියා සිටියේය.

දහයයි-10 තරගාවලිය එළිදැක්වීම සඳහා පෙරේද (20 වැනිද) කොළඹ සිනමන් ලේක් හෝටලයේදී පැවැති මාධ්‍ය හමුවේදී අදහස් දක්වමින් ශ්‍රී ලංකා ක්‍රිකට් බලධාරීන් ඒ බව සඳහන් කළ අතර එම අවස්ථාවට ක්‍රිකට් ආයතනයේ සභාපති ශම්මි සිල්වා, ලේකම් මොහාන් ද සිල්වා, ප්‍රධාන විධායක නිලධාරී ඈෂ්ලි ද සිල්වා, දහයයි-10 ග්ලෝබල් ස්පෝට්ස්හි සභාපති සාජ් උල් මලික් සහ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී රජීව් ඛන්නා යන මහත්වරු සහභාගි වූහ.

■ -036


## වේල්ස් කුමර විදුහල ක්‍රිකට් පුහුණුකරුවන් බඳවා ගැනීම

අප විදුහලේ පහත තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- ක්‍රිකට් ප්‍රධාන පුහුණුකරු ජ්‍යෙෂ්ඨ (01)
- ක්‍රිකට් පුහුණුකරු කනිෂ්ඨ (01)
- ක්‍රිකට් පුහුණුකරු පුහුණු පාසල (01)
- ක්‍රිකට් සහාය පුහුණුකරු (04)
- ක්‍රීඩාපිටි සහායක (02)

ඉහත පුරප්පාඩු සඳහා ජීවදත්ත පත්‍රිකාවක් පහත ලිපිනයට 30.11.2022 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් 'ක්‍රිකට් තනතුරු' ලෙස සටහන් කර යොමු කළ යුතුය.

**විදුහල්පති, වේල්ස් කුමර විදුහල මොරටුව**


# ශ්‍රී ලංකාවට ඩොලර් 43000 ක ලෝක කුසලාන ප්‍රවේශපත්

■ නාමල් පතිරගේ

**කටාර් රාජ්‍යයේදී ආරම්භ වූ ලෝක කුසලාන පාපන්දු තරගාවලියේ ප්‍රවේශ පත්‍ර බෙදා දීමේ පංගු ක්‍රමය යටතේ ශ්‍රී ලංකාවට ඇමෙරිකානු ඩොලර් 43000 ක ප්‍රවේශ පත්‍ර තොගයක් ලබාදී ඇතැයි වාර්තාවේ.**

මෙය ශ්‍රී ලංකාවේ මුදලින් රුපියල් එක්කෝටි හැට ලක්ෂයකට ආසන්න වන වටිනාකමකින් යුක්තය. අන්තර් ජාතික පාපන්දු සම්මේලනය ලෝක කුසලාන පාපන්දු තරගාවලියේ ප්‍රවේශපත්‍ර සිය සාමාජික රටවලට බෙදා දීමේ පංගු ක්‍රමය යටතේ අලෙවිය සඳහා මෙම ප්‍රවේශ පත්‍ර තොගය ශ්‍රී ලංකාවට ලැබී තිබේ.

තෝරාගත් තරග සඳහා ඉතා සීමිත ප්‍රවේශපත්‍ර තොගයක් දැඩි කොන්දේසි මාලාවක් යටතේ මෙලෙස ශ්‍රී ලංකාවට ද ලබාදී තිබේ. මෙම ප්‍රවේශපත්‍රයක අවම මිල ශ්‍රී ලංකාවේ මුදලින් රුපියල් 25000 ක් පමණ වන අතර උපරිම මිල රුපියල් ලක්ෂ තුනක් පමණවේ.

මෙම ප්‍රවේශ පත්‍ර මිලදී ගෙන වීසා ක්‍රියාවලිය සම්පූර්ණ කර තරග නැරඹීමට කටාර් රාජ්‍යයට ඇතුළුවන්නන්ට තරග සංවිධායකයන් විසින් නම් කෙරෙන හෝටල්වලින් පමණක් නවාතැන් ගැනීමේ අවසරය හිමිව තිබේ. තමන් නරඹන තරගය හෝ තරග කිහිපය අවසන් වූ සැනින් කටාර් රාජ්‍යයෙන් පිටවී යාම ප්‍රවේශපත්‍ර අලෙවියේ දී පනවා තිබෙන තවත් කොන්දේසියකි.

ලෝක කුසලාන තරග සමයේ කටාර් රාජ්‍යයේ උද්ගතව තිබෙන අධික තදබදය හා නවාතැන් පහසුකම් දුෂ්කරතා එම කොන්දේසියට හේතුවී තිබේ.

කෙසේ වුවත් මෙවර ලෝක කුසලාන තරගාවලිය පැවැත්වෙන විට ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ ක්‍රියාකාරීත්වය අත්හිටුවා තිබෙන අතර ඒ හේතුවෙන් එහි සමාරම්භක උත්සවයට ශ්‍රී ලංකාවේ පාපන්දු ප්‍රධානීන්ගේ සහභාගීත්වය වැළකී ගොස් තිබේ.

කෙසේ වුවත් පාපන්දු සම්මේලනයේ සභාපති ධුරය දැරූ ජස්වර් උමාර් මහතා කටාර් පාපන්දු සම්මේලනයෙන් පෞද්ගලිකව ආරාධනා ලබා සමාරම්භක උත්සවයට සහභාගිවීම සඳහා දිවයිනෙන් පිටත්ව ගොස් තිබේ.

# ඉක්වදෝරයට එංගලන්තයට ජය

**කටාර් රාජ්‍යයේදී පෙරේදා (20) ආරම්භ වූ ලෝක කුසලාන පාපන්දු තරගාවලියේ සමාරම්භක තරගයෙන් සත්කාරක කටාරය ගෝල 2-0 කින් පරාජය කිරීමට ඉක්වදෝරය සමත් විය.**

මේ අතර ඊයේ රාත්‍රියේ පැවැති බී කාණ්ඩයේ තරගයකදී එංගලන්තය විසින් ඉරානය ගෝල 6-2 කට පරාජය කරන ලදී. ගෝල 3-0 කට එහිදී එංගලන්තය පෙරමුණ ගනිමින් මෙම විශිෂ්ට ජය වාර්තා කළේය.

තරගයේ 35-43-45-62-71 හා 89 යන විනාඩිවලදී එංගලන්තය ගෝල වාර්තා කරන අතර ඉරානය දඬුවම් පහරක්ද සාර්ථක කර ගනිමින් 65 හා දෙවැනි භාග අතිරේක 13 වැනි විනාඩියේදී (90+13) ගෝල ලැබීය.

ඉක්වදෝරය ගෝල දෙකම තරගයේ පළමු භාගයේදීම වාර්තා වූ අතර නායක එනර් වැලෙන්සියා 16 වැනි විනාඩියේදී දඬුවම් පහරක් නිවැරදිව එල්ලයට යොමු කිරීමෙන් පළමු ගෝලයත් හා 31 වැනි විනාඩියේදී දෙවැනි ගෝලයත් වාර්තා කරමින් මෙම අනගි ජයග්‍රහණයට අඩිතාලම දැමීය.



එංගලන්තය සහ ඉරානය අතර තරගයේ අවස්ථාවක්...

මෙම සමාරම්භක තරගය නැරඹීම සඳහා 673227 දෙනෙක් ''අල් බයිට්'' ක්‍රීඩාංගණයට රැස්ව සිටියහ. සමාරම්භක තරගය ලෙස ප්‍රේක්ෂකයන්ගේ ඉහළ අවධානය දිනාගත් මෙම තරගයේදී කටාර් ක්‍රීඩකයෝ සිවුදෙනෙක් හා ඉක්වදෝර ක්‍රීඩකයෝ දෙදෙනෙක් විනිසුරු ඉතාලි ජාතික ඩැනිලේ ඔසාටෝ මහතා වෙතින් දැඩි අවවාද ලැබ කහකාඩ් පත් ලැබූහ.

මෙම ජයග්‍රහණයත් සමග ඉක්වදෝරය මූලික වටයේ ''ඒ'' කාණ්ඩයේ ප්‍රසාද ලකුණු සටහනේ පෙරමුණ ගැනීමට සමත්වුණේ ලකුණු තුනක් ලබා ගනිමිනි.

කටාර් ලෝක කුසලාන තරගාවලියේ මූලික වටයේ තරග මෙතැන් සිට පැවැත්වෙන අතර ඊයේ (21) සෙනගල් රාජ්‍යය හා නෙදර්ලන්තය අතර (ඒ කාණ්ඩය) තවත් තරගයක් පැවැත්වීමට නියමිතව තිබුණි.

**අද (22) දිනයේදී පැවැත්වීමට නියමිත ලෝක කුසලාන පාපන්දු තරග (ශ්‍රී ලංකා වේලාවෙන්)**

ආජන්ටිනාව හා සෞදි අරාබිය අතර (''සී'' කාණ්ඩය) - පස්වරු 3.30 ට

මෙක්සිකෝව - පෝලන්තය අතර (''සී'' කාණ්ඩය) රාත්‍රී 9.30ට

ඩෙන්මාර්කය - ටියුනීසියාව අතර (''ඩී'' කාණ්ඩය) පස්වරු 4 ට

එක්සත් ජනපදය- වේල්සය අතර (''බී'' කාණ්ඩය) මධ්‍යම රාත්‍රී 12.00 ට





දිනය 2022.11.20 ඉරිදා නිල ප්‍රතිඵල | NLB www.nlb.lk

**මහජන සම්පත** — දිනුම් වාරය : 4945 | දිනා ඇති මුළු මුදල රු. 8,295,550.00 | මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු.48,175,264.00 | ජයග්‍රාහී අක්ෂරය S | ජයග්‍රාහී අංක 0 3 3 9 2 4

**ගොවි සෙත** — දිනුම් වාරය 3187 | දිනා ඇති මුළු මුදල රු.4,728,320.00 | ඉංග්‍රීසි අක්ෂරය T | ජයග්‍රාහී අංක 03 07 16 80 | මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 61,959,399.20

**ජාතික සම්පත** (JATHIKA SAMPATHA) — දිනුම් වාරය : 1400 | දිනා ඇති මුළු මුදල රු. 2,599,780.00 | ජයග්‍රාහී ලග්නය වෘෂභ | ජයග්‍රාහී අංක 3 1 9 7 6 8 | මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 10,950,434.40

**ධන නිධානය** — දිනුම් වාරය : 975 | දිනා ඇති මුළුත්‍යාග මුදල රු.2,113,820.00 | ඉංග්‍රීසි අක්ෂරය F | ජයග්‍රාහී අංක 42 44 64 71 | මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු.133,813,396.80

**හඳහන** (Handahana) — දිනුම් වාරය 254 | දිනා ඇති මුළු මුදල රු.6,679,080.00 | ජයග්‍රාහී ලග්නය ධනු | ජයග්‍රාහී අංක 34 36 38 41 | විශේෂිත ලග්නය ධනු | මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 3,089,077.00

**කෝටි 28+ Mega POWER මෙගා පවර්** — දිනුම් වාරය : 1293 | දිනා ඇති මුළු මුදල රු.2,885,420.00 | මීළඟ මෙගා සුපිරි ත්‍යාගය රු.281,127,566.00 | මීළඟ පවර් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00 | මීළඟ ගුණ්ඩි සුපිරි ත්‍යාගය රු.10,000,000.00 | ඉංග්‍රීසි අකුර L | සුපිරි අංකය 01 | ජයග්‍රාහී අංක 07 12 13 56

ජාතික ලොතරැයි මණ්ඩලය | தேசிய லொத்தர் சபை | National Lotteries Board | දු.ක. : 011-4607000, 011 - 4607001 - 2 | ෆැක්ස් : 011-4669475 | Email : info@nlb.lk | Web : www.nlb.lk

අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ.මුදලිගේ මාවත, කොළඹ 01.


කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරණ ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2022 නොවැම්බර් මස 22 වැනිදා අඟහරුවාදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.